(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක 369.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 ජූනි මස 17 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2620/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ පවතින විරැකියා අනුපාතය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා වියුක්ති ගැටලුව සඳහා ලබා දෙන විසඳුම් කවරේද;

(iii) එම විසඳුම් මගින් සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්ක කවරේද;

(iv) එම ඉලක්ක ළඟාකර ගැනීමට ගතවන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3148/'12

2.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2009, 2010, 2011, 2012 සහ 2013 යන වර්ෂවල දී ලබාගෙන ඇති ශුද්ධ ණය ප්‍රමාණයන් කවරේද;

(ii) ශුද්ධ සංචිත විශාල වශයෙන් වැඩිවෙමින් පවතින බවට රජය විසින් සිදු කරනු ලබන ප්‍රකාශයට අනුව ඉහත කී වර්ෂ තුළදී සංචිත වැඩි වී ඇති ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා සංචිතවලට ඇතුළත් කරන ලද දිගු කාලීන ණය ප්‍රමාණය කොපමණද;

(ii) පසුගිය වර්ෂ තුන තුළ එක් එක් වර්ෂයේදී ආනයනයේ ප්‍රතිශතයක් වශයෙන් සංචිත ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) සංචිතවල තත්ත්වය ප්‍රකාශ කරනු ලබන තරමට ධනාත්මක නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3452/'13

3.

ගරු පී. හැරිසන් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 වර්ෂයේදී වගා හානි සිදු වූ උතුරු මැද පළාතේ ගොවීන් අතරින් වගා ණය ලබා ගෙන ඇති ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොවීන් වගා ණය ලබා ගත් බැංකු හා වෙනත් ආයතන කවරේද;

(iii) එම වගා ණයවලට අදාළව පොලියෙන් කපා හරින ලද මුදල කොපමණද;

(iv) එලෙස කපා හරින ලද පොලිය එක් එක් බැංකුව හෝ ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3649/'13

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩ කර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩ කිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩ කිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩ කිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩ කිරීමට අවසර ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3717/'13

5.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගම, ලංකා බැංකුව, මහජන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන ආයතන විසින් පසුගිය වර්ෂ 03 තුළ පුවත් පත්, ගුවන් විදුලි, රූපවාහිනී හා වෙබ් අඩවි දැන්වීම් වෙනුවෙන් වැය කර ඇති මුදල වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආයතන මගින් දැන්වීම් ලබා දී ඇති මාධ්‍ය ආයතන කවරේද;

(iii) ඉහත ආයතන මගින් එම එක් එක් මාධ්‍ය ආයතනය වෙත පසුගිය වර්ෂ 03 තුළ ලබාදී ඇති දැන්වීම්වල වටිනාකම වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3733/'13

6.

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සවුදි අරාබියේදී ගෙල සිදීමේ දඬුවමට හසුව මියගිය මුත්තූර්හි, බාලවයස්කාර රිසානා නාෆික් නමැති පාසල් ශිෂ්‍යාව රවටා ව්‍යාජ ගුවන් ගමන් බලපත්‍ර ඇතුළු ලියකියවිලි සාදා විදේශගත කිරීමේ වරද හේතුවෙන් ලියාපදිංචිය අහෝසි කළ "ඔමාර් ට්‍රැවල්ස්" නමැති රැකියා ඒජන්සිය නැවත "ඔමල්කා ට්‍රැවල්ස්" යන නාමයෙන් ලියාපදිංචි වී ඇති බව දන්නේද;

(ii) අසාධු ලේඛනගතවූ "ඔමාර් ට්‍රැවල්ස්" ඒජන්සිය එම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ම වෙනත් නමකින් ලියාපදිංචි කිරීමට අවසරදීමට හේතු කවරේද;

(iii) එවැනි අවසරදීමක් සිදුකිරීම හේතුවෙන් කූට ඒජන්සිකරුවන් තව තවත් අපරාධවලට පෙලඹෙන බවත්, ව්‍යාජ ලිපිලේඛන සෑදීමට බිය නොවන බවත් පිළිගන්නේද;

(iv) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4334/'13

7.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ජාතික පාසල්වල විදුහල්පති තනතුරු සඳහා පුරප්පාඩු පවතින්නේද;

(ii) එසේ නම්, විදුහල්පති පුරප්පාඩු පවතින එම පාසල් කවරේද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා මෑතකදී අයදුම්පත් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

(v) එම අයදුම්පත් කැඳවීමෙන් පසුව තෝරාගන්නා ලද විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතික පාසලක විදුහල්පතිධුරයක් දැරීම සඳහා තිබිය යුතු අධ්‍යාපනික සුදුසුකම් කවරේද;

(ii) දැනට සේවය කරන ජාතික පාසල් විදුහල්පතිවරුන් ඉහත සඳහන් සුදුසුකම් සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4486/'13

8\.

ගරු තිස්ස අත්තනායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වසරක් පාසා හලාවත මෝය ස්වභාවිකව ගොඩ වීම හේතුවෙන් එම ප්‍රදේශයේ ධීවර ජනතාව දැඩි අපහසුතාවයකට පත්වන බවත්;

(ii) මෝය ගොඩ වීම හේතුවෙන් මේ වන විට බෝට්ටු දියත් කිරීමේදී සිදු වූ අනතුරුවලින් පුද්ගල මරණ සහ බෝට්ටු විනාශවීම් රැසක් සිදුවී ඇති බවත් ;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හලාවත මෝය සංවර්ධනය කිරීම සඳහා මේ වන විට කිසියම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද;

(ii) හලාවත මෝය ගොඩ වීම පිළිබඳ සුදුසු පරීක්ෂාවක් සිදු කොට ඒ සඳහා ස්ථිර විසඳුමක් ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ක්‍රියාමාර්ග තුළින් එකී මෝය සංවර්ධනය කිරීම සඳහා ගත වන කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4570/'13

9\.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් ආකාරයට වයස අවුරුදු 60 ඉක්මවන සෑම පුද්ගලයකුටම විශ්‍රාම වැටුපක් ලබා දීමේ ක්‍රමයක් රජය මගින් හඳුන්වා දී තිබේද;

(ii) මේ වන විට එම විශ්‍රාම වැටුප ලබා දෙන වයස අවුරුදු 60 ඉක්මවූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ක්‍රමය මගින් එක් අයකුට ලැබෙන මාසික විශ්‍රාම වැටුප් මුදල කොපමණද;

(iv) වයස අවුරුදු 60 ඉක්මවූ සෑම අයකුටම එම විශ්‍රාම වැටුප ලබා දීම සහතික කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වසරේ ජූලි මාසයේ සිට හඳුන්වා දීමට යෝජිතවූ ඉහත සඳහන් විශ්‍රාම වැටුප් ක්‍රමය මේ දක්වා ආරම්භ කර නොමැති නම්, එකී පොරොන්දුව ඉටු කිරීමට පියවර ගනු ලබන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4748/’14

10\.
ගරු අශෝක් අබේසිංහ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ ඇති ලියාපදිංචි ව්‍යාපාරික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපාර වර්ගීකරණය කර තිබේද;

(iii) එසේ නම්, එම වර්ගීකරණය කර ඇති ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති ලියාපදිංචි ව්‍යාපාරික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපාර වර්ගීකරණය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2621/’12

11\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009, 2010 සහ 2011 යන වර්ෂයන්හිදී නැගෙනහිර නවෝදය වැඩසටහන යටතේ නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වූ වැඩසටහන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත වැඩසටහන් සඳහා,

(i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැය කළ මුදල;

(ii) විෂය මට්ටමින් වැය කළ මුදල;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නැගෙනහිර පළාතේ සංවර්ධනය සඳහා ඉහත වැඩසටහන් ප්‍රමාණවත් වේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3230/’12

12\.
ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා විදුලිබල මණ්ඩලයට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකුට දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3650/'13

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැලිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩ කරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩ කර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩ කිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා වැලිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩ කිරීම නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩ කිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩ කිරීමට අවසර ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3824/'13

14.

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ශික්ෂණ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් රෝහලේ සේවය කරන සනීපාරක්ෂක කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝහල්වල සිටින රෝගීන් වෙනුවෙන් සනීපාරක්ෂක කම්කරුවන් ඉටුකරන කාර්යභාරය කවරේද;

(iv) එක් එක් ශික්ෂණ රෝහලේ සනීපාරක්ෂක කම්කරුවන් සඳහා දීමනා ඇතුළුව වැටුප් සඳහා ලබාදී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂයේදී එක් එක් ශික්ෂණ රෝහලේ සනීපාරක්ෂක කටයුතු සඳහා පුද්ගලික අංශයට ගෙවා ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මුදල් ගෙවා ඇති පුද්ගලික ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4092/’13

15.

ගරු අනුර දිසානායක මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් ඒ යටතේ පුහුණුවන සිසුන් වෙනුවෙන් 2013 වර්ෂයේදී කොළඹ දී පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැඩමුළු පවත්වන ලද දිනයන් හා එක් එක් වැඩමුළුව සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව කවරේද;

(iii) එම වැඩමුළුවල පරමාර්ථ කවරේද;

(iv) එම වැඩමුළුවලට සහභාගී වූ දේශකයින් කවුරුන්ද;

(v) එම එක් එක් වැඩමුළුව වෙනුවෙන් ප්‍රවාහන, ආහාර, දේශන ගාස්තු ඇතුළුව සිදු කළ සමස්ත වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— වරප්‍රසාද,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2014 මැයි මස 07 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග අංක 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 212/'14

1.

ගරු අචල ජාගොඩගේ මහතා

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය

ගරු ජානක බණ්ඩාර මහතා

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු ජේ. ආර්. පී. සූරියප්පෙරුම මහතා

ගරු නිමල් විජේසිංහ මහතා

ගරු ආර්. දුමින්ද සිල්වා මහතා,— එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය මගින් ශ්‍රී ලංකාවට එරෙහිව පැවැත්වීමට නියමිත පරීක්ෂණය සිදු නොකළ යුතු බව,— එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය මගින් ශ්‍රී ලංකාවට එරෙහිව පැවැත්වීමට නියමිත පරීක්ෂණය ශ්‍රී ලංකාවේ සංහිඳියාවේ ක්‍රියාදාමයට හා සාමයට හානිකර වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වයට, අභිමානයට හා උදාරත්වයට අභියෝගයක් වන හෙයින්ද, එකී පරීක්ෂණය සිදු නොකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

*2.

ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— සමාගම් පනත සහ සමිති ආඥාපනත යටතේ නියෝග,— 2007 අංක 7 දරන සමාගම් පනතේ 477 හා 157(5) වැනි වගන්ති සමග කියවිය යුතු, 527 වැනි වගන්තිය යටතේ, සහ 2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) පනත සමග කියවිය යුතු, 1891 අංක 16 දරන (123 වැනි අධිකාරය වූ) සමිති ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 දෙසැම්බර් 18 දිනැති අංක 1841/8 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ සහ 2014 ජනවාරි 27 දිනැති අංක 1847/2 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ පළ කරනු ලැබ, 2014.06.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති

කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*8.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

11.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

12.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**